**කළමනාකරණය පිළිබඳ පශ්වාත් උපාධි ආයතනය - 2016**

**-------------------------------------------------------------------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්වාත් උපාධි ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය, 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන පොලී ආදායම ලෙස රු. 21,203,277 ක් ගැලපිය යුතු වුවද රු. 21,035,246 ක් ලෙස ගලපා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

(i) ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂය අවසාන වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු. 66,555,653 ක් වූ ගොඩනැගිලි සහ මෝටර් රථ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව එම වත්කම්වල ක්ෂය අනුපාත ඇස්තමේන්තු කිරීමේදී ඇති වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ii) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කර ඇතිවිට ඒ පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකළ යුතු බවට ප්‍රමිතයේ 86 ඡේදයේ දක්වා ඇති නමුත් 2014 අප්‍රේල් 01 දින ප්‍රත්‍යාගණනය කරන ලද පිරියත උපකරණ ගෘහභාණ්ඩ, කාර්යාලීය උපකරණ සහ රසායනාගාර හා ඉගැන්වීම් උපකරණවල වටිනාකම, ක්ෂය අනුපාත හා සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල වටිනාකම ගිණුම් සටහන්වලින් හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අවලංගු කරන ලද රු. 28,536 ක චෙක්පතක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පතක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් පොත අනුව බැංකු ශේෂය හා අදාල වියදම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ අවසන් කාර්තුව වෙනුවෙන් පාඨමාලා ගාස්තු සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස රු. 1,354,756 ක මුදලක් 2017 පෙබරවාරි මාසයේදී ගෙවා තිබුණද, එය උපචිත වියදමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජූලි ආරම්භ කර තිබුණු මාස 24 ක උපාධි පාඨමාලාවක් සඳහා අපේක්ෂකයන් 45 දෙනෙකු ලියාපදිංචි කර තිබුණි. එක් අපේක්ෂකයෙකුගේ පාඨමාලා ගාස්තුව රු.575,000 ක් වූ බැවින් ඔවුන්ගෙන් අයකළ යුතු සම්පූර්ණ පාඨමාලා ගාස්තු ආදායම වූ රු. 25,875,000 කින් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම රු. 6,468,750 ක් වුවත් එය රු. 5,228,750 ක් ලෙස එනම් රු. 1,240,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2007 වර්ෂයේදී ඩුබායි නගරයේදී ජාත්‍යන්තර ශාඛාවක් ආරම්භ කර තිබූ අතර වංචාවක් හේතුවෙන් 2009 සැප්තැම්බර් මාසයේදී එම ශාඛාව වසා දමා තිබූ නමුත්, එම ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ වශයෙන් පිළිවෙලින් රු.2,079,000 ක් හා රු. 11,603,217 ක් දීර්ඝ කාලයක සිට පැවතියද එම ශේෂ සම්බන්ධයෙන් විමර්ශනයන් සිදුකර නිරවුල් කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2012 වර්ෂයේදී විශ්‍රාම ගිය ආයතනයේ හිටපු අධ්‍යක්ෂවරයාගෙන් සහ නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරයාගෙන් අයවිය යුතු පිළිවෙලින් එකතුව රු. 2,874,482 ක් සහ එකතුව රු. 1,018,174 ක්වූ අර්ථසාධක අරමුදල් ණය හා ආපදා ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය** | |
| (i) 9 වන පරිච්ඡේදයේ 5.1 (අ) වගන්තිය සහ 7 වන පරිච්ඡේදයේ 21.1 හා 21.3 වගන්ති | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයාට සහ පද්ධති විශ්ලේෂක I ශ්‍රේණියේ නිලධාරියෙකුට අතිකාල දීමනා සහ වර්ෂයේ සියළුම නිවාඩු දින සඳහා නිවාඩු දින වැටුප් වශයෙන් එකතුව රු. 1,410,600 ක් ගෙවා තිබුණි. |
| (ii) 26 පරිච්ඡේදයේ 2.1 වගන්තිය | මුදල් වර්ෂය අවසාන වන දිනයේ දී ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, ඒ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් හරි වැරදි බැලිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ පුස්තකාල පොත් පිළිබඳව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 135 | පුරප්පාඩුව පැවති පොත් තබන්නා තනතුර ආවරණය කිරීමට පරිගණක යෙදවුම් සහකාරවරියක යොදා ගෙන තිබුණු අතර, මුදල් පොත පවත්වාගෙන යාම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම, මූලික පොත් සහ ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම, පරිගණක ආශ්‍රිත ගිණුම් කටයුතු, වවුචර් පිළියෙල කිරීම සහ මුදල් භාරකරුගේ වැඩ ආවරණය කිරීම ආදී කටයුතු සියල්ල එම නිලධාරිනියට පවරා තිබුණි. |
| (ඇ) 2015 ජුලි 14 දිනැති 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) මාණ්ඩලික නිලධාරීන්ට පමණක් තත්කාර්ය අත්තිකාරම් ලබාදිය හැකි වුවද මාණ්ඩලික නොවන යතුරු ලේඛිකා, රියදුරු සහ යන්ත්‍ර ක්‍රියාකරු යන තනතුරුවල නිලධාරීන්ට සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 11 කදී එකතුව රු.1,375,500 ක අත්තිකාරම් ලබාදී තිබුණි.<br>(ii) තත්කාර්ය අත්තිකාරම් උපරිම සීමාව වන රු.100,000 ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 07 කදී රු.1,282,000ක අත්තිකාරම් ලබා දී තිබුණි. |

| | |
|---|---|
| | (iii) 2016 වර්ෂයට අදාලව නිකුත්කර තිබූ එකතුව රු.1,619,400 ක අත්තිකාරම් 04 ක් දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් චක්‍රලේඛයේ ඇමුණුම් අංක 01 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 4 වගන්තියේ iii වන උපවගන්තිය | කාර්තුව අවසන් වී ඊළඟ මාසයේ 20 වෙනි දිනට හෝ ඊට පෙර ජාතිය ගොඩනැගීමේ බදු දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු වුවත් අදාල බදු මුදල් දින 5 සිට දින 68 දක්වා කාලයක් ප්‍රමාද වී ගෙවා තිබුණි. |
| (ඊ) 2015 අගෝස්තු 31 දිනැති අංක 241.4 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | දිනකට පැය 08 ඉක්මවා වැඩකරන දිනයක් සඳහා ඉන්ධන දීමනා ලබාගත හැකි වුවද පැය 08 කට වඩා අඩුවෙන් වැඩ කළ දිනයන්ද ඉන්ධන දීමනා ගෙවීම් ගණනය සඳහා සැලකිල්ලට ගෙන තිබීම නිසා වර්ෂය තුළ රු.365,400 ක ඉන්ධන දීමනා වැඩියෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.92,366,483 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.40,054,887 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 52,311,596 කින් වර්ධනයවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ගාස්තු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.93,969,136 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලය ක්‍රමානුකූල පිරිහීමක් පෙන්නුම් කළද 2015 වර්ෂයේ සිට වර්ධනය වෙමින් පැවතුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය හා බදු නැවත ගැලපීම් කිරීමෙන් පසුව 2012 වර්ෂයේ රු.81,701,992 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 188,991,962 තෙක් වර්ධනය වී තිබුණි.

**3.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම**

------------------------------

ඉකුත් වර්ෂයේ වියදම් සමඟ සලකා බැලීමේදී පහත සඳහන් වියදම්වල අසාමාන්‍ය වර්ධනයක් පැවති බව නිරීක්ෂණය විය.

| <u>වියදම</u> | <u>සමාලෝචිත වර්ෂය</u> | <u>ඉකුත් වර්ෂය</u> | <u>වැඩිවීම</u> | <u>ප්‍රතිශතය</u> |
|---|---|---|---|---|
| | රු | රු | රු | |
| විදේශ ගමන් වියදම් | 1,477,653 | 357,752 | 1,119,901 | 313 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 18,237,575 | 3,540,866 | 14,696,709 | 415 |
| සංග්‍රහ වියදම් | 2,218,100 | 1,051,639 | 1,166,461 | 111 |
| බැංකු ගාස්තු | 1,002,702 | 210,229 | 792,473 | 377 |
| උපාධි ප්‍රදානෝත්සව වියදම් | 6,342,937 | 1,405,000 | 4,937,937 | 351 |

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

**------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ හිටපු නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පවරා ඇති අංක LT/01/05/2012 දරන නඩුවට අදාළ වගඋත්තරකරුවකු වශයෙන් ආයතනය නම් කර තිබුණි.

(ආ) ආයතනයේ ඩුබායි ශාඛාවේ රු.මිලියන 58.2ක වංචාව සම්බන්ධයෙන් 2009 වර්ෂයේදී පැවති පොදු ව්‍යාපාර කමිටු වාර්තාව මගින් සිදු කරන ලද නිර්දේශ ප්‍රකාරව, 2011 මාර්තු 29 දින විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අදාල විමර්ශනයේ උද්‍යත නීතිපති වෙත යොමු කර ඇති බව 2014 ජූනි 16 දින අධ්‍යක්ෂකවරයා වෙත දන්වා තිබුණ ද, ආයතනය විසින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු නොකිරීම නිසා 2017 නොවැම්බර් 30 වන විට ද අදාල නඩු පැවරීම් සිදුකර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**4.1 කාර්යසාධනය**

**---------------**

සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් ව්‍යාපාර පරිපාලනාධිපති රේගු හා ජාත්‍යන්තර වෙළඳාම, විධායක ව්‍යාපාර පරිපාලනාධිපති සහ ව්‍යාපාර පරිපාලනාධිපති (කටාර්) යන නව උපාධි පාඨමාලා ආරම්භ කර තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**--------------------------------**

භාණ්ඩ හෝ සේවා සැපයුමක් සඳහා වටිනාකමින් කොටසක් කලින් ගෙවීමට සිදුවන අවස්ථාවලදී අදාල ආයතනවලට ගෙවන කොටස් මුදල වියදමෙහි කොටසක් ලෙස හෝ වාරික ගෙවීමක් ලෙස හෝ සලකා වෙනම සටහන් තැබීම වෙනුවට ඒවා තත්කාර්ය අත්තිකාරම් ලේඛනයෙහි සටහන් කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 27 කදී ගෙවන ලද රු. 13,495,132 ක් මෙසේ තත්කාර්ය අත්තිකාරම් ලේඛනයෙහි සටහන් කර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 18 සිට 27 දක්වා ආයතනය විසින් ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට්ස්කූල් විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද ණය කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා දේශීය පුහුණුලාභීන් 07 දෙනෙකු හා ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු ද සහභාගීවී තිබුණි. මෙම වැඩසටහන සඳහා රු. 575,000 ක් බැගින් බාහිර ආයතනවල නිලධාරීන් 07 දෙනෙකු ගෙන් රු.4,025,000 ක් ලැබී තිබූ අතර වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම රු.7,330,731 ක් විය. ඒ අනුව මෙම වැඩසටහන තුළින් ආයතනයට රු. 3,305,731 ක පාඩුවක් සිදුවී ඇති බව ගිණුම් අනුව නිරීක්ෂණය වූ අතර මේ පිළිබඳව වැඩිදුරටත් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු ද නිරීක්ෂණය විය.

(i) පාඨමාලාව දින 04 ක් සඳහා සැලසුම් කර තිබුණු අතර යාමට හා ඒමට ගතවන දින දෙකට අමතරව වැඩිපුර දින 04 ක් සහභාගීවූවන් ජර්මනියේ ගත කර තිබුණි. ඒ අනුව අතිරේක දින 04 ක් සඳහා ආයතනයේ නිලධාරීන් දෙදෙනාට සංයුක්ත දීමනා සහ අනියම් දීමනා ගෙවා තිබුණු අතර පුහුණුලාභීන් සියළු දෙනා වෙනුවෙන් එම අතිරේක දින 04 ක් සඳහා නවාතැන් ගාස්තුද ගෙවා තිබුණි. මේ අනුව එම අතිරේක කාලය සඳහා ආයතනය රු. 1,448,470 ක වියදමක් දරා තිබුණි.

(ii) 2015 මැයි 12 දිනැති අංක මු.අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 (ඇ) වගන්තිය අනුව ආයතනය නියෝජනය කරන කණ්ඩායමට ඇතුළත් විය යුත්තේ එම කාර්යය සඳහා අවශ්‍ය අවම නිලධාරීන් සංඛ්‍යාවක් පමණක් වුවද පුහුණුලාභීන් 07 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් කළමනාකරණය කිරීමට ආයතනයේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කර වීම මතභේදයට තුඩු දෙන්නකි.

(iii) ඉහත පාඨමාලාව සඳහා බාහිර ආයතනයන්ගෙන් පුහුණුලාභීන් ලෙස සහභාගී කරවන ලද නිලධාරීන් සඳහා එක් නිලධාරියෙකුගෙන් රු. 575,000 ක් බැගින් අයකර තිබුණද සත්‍ය වශයෙන් එක් අයකු සඳහා රු. 669,243 ක වියදමක් ආයතනයට දැරීමට සිදුවී තිබුණි. මේ අනුව එක් එක් පුහුණුලාභියා වෙනුවෙන් රු. 94,243 බැගින් රු. 659,701 ක අතිරේක වියදමක් දැරීමට ආයතනයට සිදුවී තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

ආයතනයේ මාසික ගෙවීම් රු. මිලියන 13 ත් - රු. මිලියන 27 ත් අතර පරාසයක පැවතියද වියදම් පිළිබඳව නිවැරදිව පුරෝකථනය නොකිරීම හේතුවෙන් වර්ෂය මුළුල්ලේ රු. මිලියන 17.03 ත් රු.මිලියන 83.70 ත් අතර ඉතා ඉහල පරාසයක මුදල් ශේෂයක් ප්‍රධාන ජංගම ගිණුමේ පවත්වා ගෙන ගොස් තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 48 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් 2017 ඔක්තෝබර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීම වෙනුවට අනුමත කාර්ය මණ්ඩලය වෙනුවෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 11 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. ගිණුම් අංශය සඳහා ප්‍රමාණවත් පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම හේතුවෙන් නිවැරදිව ගිණුම් පොත්පත් පවත්වා ගෙන යාමට ආයතනයට නොහැකි වී තිබුණි.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පරිගණක යෙදවුම් සහායකයකු සහ රියදුරෙකු බඳවා ගෙන තිබුණු අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ වැඩසටහන් සහායක තනතුර සඳහා 4 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබුණි.

## 4.6 වාහන උපයෝජනය

----------------------

2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය අනුව වෙන්කළ වාහනයක් භාවිතා කිරීමට හෝ රාජකාරි කටයුතු සඳහා පෞද්ගලික වාහනය යොදාගැනීම වෙනුවෙන් ප්‍රවාහන දීමනාව ලබා ගැනීමට හිමිකම් ඇති ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් සංචිත වාහනයක් අඛණ්ඩව භාවිතා කර තිබුණි. ඒ අනුව චක්‍රලේඛය ප්‍රකාරව එම නිලධාරියාට මාසයකට හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා සමාලෝචිත වර්ෂය සඳහා රු. 212,063 ක් වටිනා ඉන්ධන ලීටර් 1,813 ක් අනුමැතියකින් තොරව භාවිතා කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

ආයතනය විසින් 2017 අප්‍රේල් 04 දින වාර්ෂික ගිණුම් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර 2017 ඔක්තෝබර් 31 දින එම ගිණුම් නැවත සංශෝධනය කර ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන සැලසුමෙන් ආවරණය කර ගැනීමට අපේක්ෂිත විෂයයන් 11 ක් දක්වා තිබූ නමුත් වර්ෂය තුළ කිසිදු විගණන කාර්යයක් සිදුකර නොතිබුණි.

(ආ) ආයතනයේ අභ්‍යන්තර විගණනය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් ආවරණය කර තිබුණි. එසේ වුවද විශ්වවිද්‍යාලයේ විගණන කටයුතුවලට අමතරව ආයතනයේ විගණන කටයුතුද ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් එම අංශයේ නොවූ අතර නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් කාර්ය මණ්ඩලය සමන්විතව පැවතුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු. මිලියන 130 ක් වැය කර ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද අදාළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 නොවැම්බර් වන විටත් ආරම්භ කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර සියයට 48 ක විචලනයක් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 7 ක අයවැයගත හා සත්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 135 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කුලී හා බදු වියදම් රු. 301,230 ක් දරා තිබුණු නමුත් ඒ සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | - | වත්කම් ප්‍රත්‍යාගණනය, අපහරණය සහ ඒ පිළිබඳ ගිණුම් තැබීමේ අඩුපාඩු සහ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | - | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීම සඳහා සුදුසුකම් ඇති සහ ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් පත්කර නොගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | - | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත සහ ප්‍රසම්පාදන සැලසුම් අනුව කටයුතු නොකිරීම. |